# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1907/54 - 2015 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2015.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ**
**කොළඹ මහ නගර සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන කොළඹ මහ නගර සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ත්‍යාගරාජා නිරෝෂ් නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත්, ඒ කොළඹ මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ආනන්දන් මුරුගයියා තිරුබාගර කුමාර් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කොළඹ මහ නගර සභාවේ තේරීම් භාර නිලධාරි සිවසුබ්‍රමනියම් අච්චුදන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ආනන්දන් මුරුගයියා තිරුබාගර කුමාර් මහතා කොළඹ මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම් භාර නිලධාරී,
කොළඹ මහ නගර සභාව.

2015 මාර්තු මස 26 වන දින,
නාගරික මැතිවරණ කාර්යාලය,
කොළඹ.

04 - 428

1A - G 21314— 17 (2015/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*